ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,027 — 1934ක්වූ ජනවාරි මස 12 වෙනි දිනවූ සිකුරාදා.

# Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Nuwara Eliya. No. 75.**—මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන් වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1934ක්වූ මාර්තු මස 5වෙනි දිනවූ සඳුදා සවස දෙකට කුඹල්ගමුවේ සෙකොලයේදී බේරුම්කරන්ට හෝ විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මිලයටගත් මුදලෙන් දහයෙන් කොටසක් ඉඩම් බේරුම්කරණ අවසාණේදී ඒජන්තතුමා වෙත භාරනොදෙන අයවළුන්ට ඉඩම් බේරාදීම කළ නොහැකිවේ. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ වලපනේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 19ක්.

මුල් සිතියමේ නො. 8,339. ගම—කුඹල්ගමුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | ප්‍රමාණය, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | දුන්කොලලන්ද .. | — .. | ඩබ්ලිව්. ගන්ඇතිරාල .. | හේන .. | 0 | 0 | 20 | 10* |
| 5 | එම .. | — .. | කේ. උක්කුමැනිකා .. | එම .. | 0 | 0 | 25 | 10* |
| 6 | එම .. | — .. | දෙන් විලියම් සිංඤෝ සහ බී. කේ. ජෝන් සිංඤෝ | එම .. | 0 | 3 | 4 | 10* |
| 8 | වැලිපිට .. | — .. | කොනගෙදර බබාහාමි සහ විලියම් සිංඤෝ | වත්ත .. | 0 | 2 | 14 | 10* |
| 10 | එම .. | — .. | කරඹිපිටියේ පුංචිරාල සහ එම රම් මැනිකා | එම .. | 0 | 1 | 24 | 10* |
| 11 | එම .. | — .. | කරඹිපිටියේ පුංචිරාල .. | හේන .. | 0 | 0 | 18 | 10* |
| 12 | වැලිපිටඅස්වැද්දුම | — .. | කරඹිපිටියේ පුංචිරාල සහ එම රම් මැනිකා | අත්හැරපු කුඹුර | 0 | 2 | 30 | 10* |
| 14 | ඇල්ලෙහේන .. | — .. | හැසිගිය කේ. කුමාරිහාමි සහ ජී. පුංචි රාලගේ උරුමක්කාරයෝ | හේන .. | 3 | 0 | 36 | 10* |
| 20 | එම .. | — .. | අස්වැද්දුමේගෙදර කිරිරාල .. | එම .. | 2 | 1 | 13 | 10* |
| 21 | වැලිපිටහේන .. | — .. | උඩවත්තෙගෙදර කිරිරාල සහ උංරු වැලෙගෙදර හිංගිරිමැනිකා | එම .. | 2 | 2 | 26 | 10* |
| 22 | වැලිපිටඅස්වැද්දුම | — .. | කරඹිපිටියෙගෙදර හිංගිරිමැනිකා .. | අත්හැරපු කුඹුර | 0 | 2 | 30 | 10* |
| 23 | වැලිපිටහේන .. | — .. | කරඹිපිටියෙගෙදර කිරිවත්තෙ .. | හේන .. | 0 | 3 | 26 | 10* |
| 25 | වැලිපිට .. | — .. | කේ. ඇස්. එච්. ද සිල්වා .. | හේන සහ තේ | 6 | 1 | 25 | 20* |
| 26 | වැලිපිටහේන .. | — .. | විජේතුංගආරච්චිගේ දවිත් අප්පුහාමි සහ එම කරලිනාහාමි | හේන .. | 1 | 1 | 18 | 20* |
| 27 | වැලිපිටහේන .. | — .. | වතුමුල්ලේ පදිංචි ඩී. සී. ඒ. යාපා .. | එම .. | 3 | 0 | 27 | 20* |
| 28 | එම .. | — .. | හැටදවත්තෙගෙදර අප්පුහාමි සහ එම මල්හාමි | එම .. | 3 | 2 | 10 | 10* |
| 29 | ඇල්ලෙහේන .. | — .. | කිතුලගෙදර බබාහාමි නොහොත් බෙන්ජමින් සොයිසා නෝනාමහත්මි | එම .. | 1 | 2 | 21 | 10* |

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 30 | ඇල්ලෙහේන | — | කේ. ඇස්. එච්. ද සිල්වා | හේන | 1 1 10 | 20* |
| 37 | වැලිපිටහේන | — | එම | හේන සහ හේන | 6 2 28 | 20* |

* බේරීමට.

මේ ඉඩම් සම්බන්ධ වැඩිදුර තොරතුරු නුවරඑළියෙ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1934ක්වූ ජනවාරිමස 8 වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෞන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Nuwara Eliya No. 76.**—මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන් වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1934ක්වූ මාර්තු මස 7වෙනි දිනවූ බදාදා සවස දෙකට වලපනේ පිහිටි රෙජිමහත්මයාගේ කන්තෝරුවේදී බේරුම්කරන්ට හෝ විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත. මිලයටගත් මුදලෙන් දහයෙන් කොටසක් ඉඩම් බේරුම්කරන අවස්ථාවේදී ඒජන්තතුමා වෙත බාරනොදෙන අයවරුන්ට ඉඩම් බේරදීම කළනොහැකිවේ. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ වලපනේ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 19ක්.

මුල් සිතියමේ අංක. ㄓ,339. ගම—කුඹල්ගමුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 32 | අඟුනවෙල්තැන්න | — | කුඹල්ගමුවේ වැවකැලේවත්තේ ඇලන් බොව් මහතා | හේන් ඉඩම | 4 0 21 | 20* |
| 33 | එම | — | එම | එම | 1 0 15 | 20* |
| 34 | එම | — | එම | එම | 0 0 39 | 20* |
| 35 | එම | — | තැන්නෙහේන්වල විදානෙ, එම කිරිබන්ඩා, එම මුතුමැණිකා සහ ඔබගෙදර මුහන්දිරම | හේන | 2 3 27 | 10* |
| 38 | වැලිපිටහේන | — | කරඹගෙදර මුහන්දිරම | එම | 1 2 15 | 10* |
| 39 | වැලිපිට | — | ජිලියගොඩගේ පුංචිහාමි | වත්ත | 1 2 10 | 10* |
| 40 | වැලිපිටවත්ත | — | වැලිපිටගෙදර මැණිකරාල | එම | 1 0 35 | 10* |
| 41 | වැලිපිටකුඹුර | — | එම | අත්හැරපු කුඹුර | 0 2 22 | 10* |
| 42 | වැලිපිටහේන | — | කරමඩගෙදර මුහන්දිරම | හේන | 0 3 3 | 10* |
| 45 | එම | — | යූ. පුංචිනෝනා | එම | 1 1 6 | 10* |
| 46 | ලියන්ගහයටහේන නොහොත් වැලිපිට හේන | — | එම | එම | 0 2 39 | 10* |
| 47 | ලියන්ගහයටවත්ත | — | එම | හේන් ඉඩම | 0 1 24 | 10* |
| 48 | එම | — | එම | එම | 0 3 2 | 10* |
| 49 | උල්මොල්ලියහේන | — | සෙලිනා අබේගුනසේකර | හේන | 1 1 7 | 20* |
| 50 | වැලිපිටහේන | — | මොහොට්ටිගෙ කර්ලිනා සේදර හාමිනේ | එම | 1 1 39 | 20* |
| 51 | වැලිපිටහේන සහ උල්මොල්ලිය | — | මොහොට්ටිගේ අන්ද්‍රයාස් සේදර අප්පුහාමි සහ එම බාහේස් සේදර අප්පුහාමි | එම | 7 0 27 | 20* |
| 52 | අඟුනාවෙල්තැන්න | — | ජේ. බී. සෙනෙවිරත්න | එම | 0 3 10 | 20* |
| 53 | එම | — | පී. කිරිරාල සහ යූ. පුංචිරාල | එම | 1 1 32 | 10* |
| 54 | එම | — | කාරියවසම්මානගෙ ජේම්ස් අප්පුහාමි සහ වෙලන්ගහතුතුගෙදර පුංචිමැණිකා | එම | 0 2 34 | 10* |

* බේරීමට.

මේ ඉඩම් සම්බන්ධ වැඩිදුර තොරතුරු නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 8වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෞන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

කාරක මන්ත්‍රණසභාවේ සම්මතය ඇතුව වර්ෂ 1911යේ 10වෙනි ආඥාපනතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකාශිතවූ වර්ෂ 1876යේ 3වෙනි ආඥාපනතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකරණ ආණ්ඩුකාර උතුමානන්වහන්සේ විසින් මෙහි පහත දක්වන ඉඩම ප්‍රසිද්ධ කටයුත්තක් සඳහා :—එනම්, කොච්චිකඩේ පොඩි ගෙවල් ඇති මුඩුක්කු හරිගැස්සීම පිණිස උවමනා බැවින් ඒ ඉඩම යුතුප්‍රකාර අයිතිකරගැණීමට අණලබනලදී, ඒ ඉඩමනම් :—

ප්‍රාරම්භ පැලෑන අංක. 19,903.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම කියාසිටින අයගේ නම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 33 | කොච්චිකඩේපාරේ වරිපනම් අංක. 52 (2) සිට 55 (8), 60 (4) සිට 60 (27), 61 (4) සිට 61 (8), 61 (11) සිට 61 (15), 63 (1) සිට 63 (36) සහ 62 (2) යෙන් කොටසක්ද | පොළීගෙවල් 95ක් ඇති තුනෙන් බැද උළුසෙවිලිකල ගෙවල් 12ක් සහ හුණෙන් බැද උළුසෙවිලිකල ගෙවල් 3කින් කොටස්ද, හුණෙන් බැදි පඩිපෙලක්ද, විදුල්ද, වතුරපයිප්ප 2ක්ද, හුණෙන් බැද උළුසෙවිලිකල ගෙයකින් කොටසක්ද, සින්ක් සෙවිලිකල මඩුවකින් කොටසක්ද, සිමෙන්ති කපලාරුකල පොළවෙන් කොටසක් සහ හුණෙන් බදිනලද මාසිම් කාප්පවලින් කොටස්ද, ලීවලින්හැදූ උළුසෙවිලිකල ගෙයක්ද, හුණෙන්බැදි කුළුනු 4ක්ද, කොන්ක්‍රීට් බොලොක්ස් 2ක්ද, ඉස්තෝප්පුද, හුණෙන් බැදපු කාණුද, සින්ක් සෙවිලිකල මඩුවක් සහ හුණෙන්බැදි මාසිම් කාප්ප 2ක්ද | හෙයිණ මරික්කාර් | 1 0 0·57 |

ඒ නිසා එකී ආඥාපනතේ 7වෙනි වගන්තියේ නියමවූ ප්‍රකාර ඉහතකී ඉඩම අයිතිකරගැනීමට අදහස්කරණ බැව් මෙයින් ප්‍රකාශකරමි.

තවද එකී ඉඩම ගැණ සැලකීමක් ඇති සියලු දෙනාම ඔවුන්ගේ අයිතිවාසිකමේ අඳුමද, ඒ වෙනුවට ඉල්ලා සිටින වටිනාකමද ඒව භුක්ති ඔප්පුද, රෙජිස්ටර් පොතේ කොපියක්ද රැගෙන ඉඩම ගැණ වටිනාකම ලැබීමට තිබෙන යුතුකම්ද පෙන්වා සිටින පිණිස තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය හෝ වර්ෂ 1934ක්වූ පෙබරවාරි මස 3වෙනි සෙනසුරාදා පෙරවරු 10ට කොළඹ නාගරික සභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 12වෙනි දින කොළඹ නාගරිකසභා කන්තෝරුවේදීය.

ඩබ්ලිව්. ඇල්. මර්ෆි,
කොළඹ නාගරික සභාවේ සභාපතිතුමා සහ නගරාධිපතිතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපනතේ 7වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—දරනගම ගම්සභාපාරේ කොටසක් හැරවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A. 215. ගම—දරනගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උදමටගහකුඹුර .. | කුඹුර .. | කේ. ඒ. දෙන් මෙලිස් සහ කේ. ඒ. දෙන් ඔබියෙස්, දරනගම | 0 0 24·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ පෙබරවාරි මස 21වෙනි දින පෙරවරු 10ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 8වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඇල්. ඇල්. හන්වර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තුන්නානේ ලිඳක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A. 203. ගම—තුන්නාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කාඹරන්කගහවත්ත .. | මුඩුබිම .. | විජේසින්හෙප්පීගේ සුවා තුන්නාන .. | 0 0 2·1 |
| 2 | එම .. | පුවක්ගසකින් යුත් මුඩුබිම | එම .. | 0 0 1·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පෙරවරු 10ගේ කනිසමට පාදුක්කේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 8වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කාර්ල් ඒ. ආන්වි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වට්ටප්පොල ගැණු පාඨශාලාවට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහාක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 126. ගම—මහනුවර පලාතේ උඩුනුවර ගඟපලාතකෝරළේ වට්ටප්පොල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කන්දයැවත්ත .. | වත්ත .. | (1) වට්ටප්පොල පදිංචි පින්චාහේනයලෑගෙදර කිරිහෙන්නයා, (2) එම පුංචි රිදී, (3) එම පුසුඹි රිදී, (4) එම ලසිහා රිදී, (5) පිකිරිබණ්ඩා වරකාවුල්ලේ ආරච්චි | 0 0 5·6 |
| 2 | එම .. | එම .. | කේ. බී. වරකාවුල්ලේ, වට්ටප්පොල ලේකම් මහත්මයා .. | 0 0 20·8 |
| 3 | එම .. | එම .. | එම .. .. .. | 0 0 10·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ පෙබරවාරි මස 9වෙනි දින පස්වරු 2ගේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 4වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ආර්. ඇන්. බෝන්ඩ්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මස්කෙලියේ සෙසිල්මේ අසූචි වැලලීමේ භූමියකට මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A. 135. ගම—මහනුවර පලාතේ උඩබුලත්ගම අඹගමුකෝරළේ මස්කෙලිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බන්යන්වත්ත .. | තේ .. | ලිප්ටන් සහ සමාගම .. .. | 0 2 0 |

එබැවින් ඉඩම අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර් 1934ක්වූ පෙබරවාරි මස 9වෙනි දින පස්වරු 2.30ට කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර් 1934ක්වූ ජනවාරි මස 5වෙනි<br>දින මහනුවර කච්චේරියේදීය.

ආර්. ඇන්. බොන්ඩ්,<br>මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වම්ස.

---

වර් 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බදුළු නගරයට ජලය සැපයීමේ දැනට තිබෙන දිය ආඩය විශාලකිරීම සහ දැනට ලැබෙන ජලය අපවිත්‍රවීමෙන් වැලැක්වීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර් 1876වෙනි ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් අවසර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

මුල් සිතියමේ නො. 37. ගම—අලුත්වෙලගම, බදුල්ලේ පලාත් නගර සභාවේ සීමාවතුළ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ජම්බුගස්තැන්න (වරිපනම් නො 18න් කොටසක්) | පතන .. .. | අඹේගොඩ පදිංචි රත්නායක මුදියන්සෙලාගේ උක්කුමැතිකා සහ අලුත්වෙලගම පදිංචි රත්නායක මුදියන්සෙලාගේ උක්කුබන්ඩා | 0 3 11·2 |
| 2 | කහවත්ත (වරිපනම් නො. 16න් කොටසක්) | වත්ත සහ හේන, අවුරුදු 20ක් පමන පරණ පොල්ගහක්ද, අවුරුදු 20ක් පමන පරණ කිතුල්ගස් 4ක්ද, අවුරුදු 10ක් පමන පරණ කොස්ගස් තුනක්ද, අවුරුදු 3ක් පමන පරණ අඹගස් 2ක්ද, අවුරුදු 3ක් පමන පරණ සපුගහක්ද, අවුරුදු 5ක් පමන පරණ කපුගහක්ද, අවුරුදු 2ක් පමන පරණ පැතිංදොඩම් ගහක්ද, මඤ්ඤොක්කා සහ එළවලුද, මැටිවලින් සාදපු ගෙයක් සහ එවැනි ගෙයකින් කොටසක්ද අඩංගුය | හැටන්ති පදිංචි පී. ඒ. බී. ඒබිස්අප්පු | 0 1 25·2 |
| 3 | මූකලාන (වරිපනම් නො. 16න් කොටසක්) | හේන, මඤ්ඤොක්කා සහ ගොඩ ධාන්‍යද තිබේ | අඹේගොඩ පදිංචි රත්නායක මුදියන්සෙලාගේ උක්කුමැතිකා සහ අලුත්වෙලගම පදිංචි රත්නායක මුදියන්සෙලාගේ උක්කුබන්ඩා | 0 2 33·1 |
| 4 | උඩගෙදරවත්ත (වරිපනම් නො. 15න් කොටසක්) | එම .. .. | අලුත්වෙලගම පදිංචි වාසලවත්තුකු මුදියන්සෙලාගේ පුංචිරාල | 0 2 35·1 |
| 5 | — .. | පාර .. .. | අලුත්වෙලගම පදිංචි රත්නායකමුදියන්සෙලාගේ උක්කුබන්ඩා | 0 0 4 |
| 6 | උඩගෙදරවත්ත (වරිපනම් නො. 15න් කොටසක්) | වත්ත, අවුරුදු 20ක් පමන පරණ සපුගහක්ද, අවුරුදු 10ක් පමන පරණ කොස්ගස් 2ක්ද, අවුරුදු 5ක් පමන පරණ පුවක්ගස් 7ක්ද, අවුරුදු 10ක් පමන පරණ අඹගස් 2ක්ද, අවුරුදු 2ක් පමන පරණ පොල්පැල 14ක්ද, මඤ්ඤොක්කා සහ ගොඩ ධාන්‍ය සහ පාරක් තිබේ | එම .. | 0 1 36·6 |
| 7 | අඹගහමුලවත්ත (නො. 14A දරණ ඉඩමෙන් කොටසක්) | වත්ත, අවුරුදු 10ක් පමන පරණ පුවක් ගහක් සහ අවුරුදු 10ක් පමණ පරණ කැකුණගහක්ද තිබේ | බදුල්ලේ පදිංචි මාරසිංහ මැතිනිය .. | 0 0 1·5 |
| 8 | උඩගෙදරවත්ත (වරිපනම් නො. 15න් කොටසක්) | වත්ත, අවුරුදු 2ක් පමන පරණ පොල් පැල 2ක් තිබේ | අලුත්වෙලගම රත්නායකමුදියන්සෙලාගේ උක්කුබන්ඩා | 0 0 3·6 |
| 9 | කොස්වත්ත, (වරිපනම් නො. 14A දරණ ඉඩමෙන් කොටසක්) | වත්ත, අවුරුදු 15ක් පමන පරණ කොස් කොස්ගහක්ද, අවුරුදු 15ක් පමන පරණ පුවක්ගහක්ද, අවුරුදු 5ක් පමන පරණ අඹගහක්ද තිබේ | අලුත්වෙලගම පදිංචි වී. ඒ. දිසානායක සහ පී. බී. දිසානායක | 0 0 2·3 |
| 10 | එම .. | හේන සහ වත්ත, සපුගස් 2ක්ද, කිතුල්ගස් 2ක්, කොස්ගහක්ද, ජම්බෝලගහක්ද, අවුරුදු 5ක් පමන පරණ අඹගහක්ද තිබේ | එම .. | 0 2 12·4 |
| 11 | හිල්ලන්දේගෙදර වත්ත, වරිපනම් නො. 13න් කොටසක්) | වත්ත, අවුරුදු 5ක් පමන පරණ සපුගස් 2ක් තිබේ | අලුත්වෙලගම පදිංචි රත්නායක මුදියන්සෙලාගේ උක්කුබන්ඩා | 0 0 2·6 |
| 12 | කොස්වත්ත (වරිපනම් නො. 14න් කොටසක්) | හේන සහ රබර් අවුරුදු 10ක් 15ක් පරණ රබර්ගස් 17ක් තිබේ | බදුල්ලේ පදිංචි ඇන්. මාරසිංහ මැතිණිය | 0 3 14·5 |
| 13 | — .. | පාර .. .. | බදුල්ලේ (ස්ප්‍රින්වැලි) බැද්දේගම සිටනැසියිය ජ. වී. රැව් මහතාගේ උරුමක්කාරයෝ | 0 0 10·2 |
| 14 | අඹගහඇල්ලේපතන (තක්සේරුකරනැත) | පතණ සහ හේන .. .. | එම .. .. | 0 3 7·8 |
| 15 | හිඟුරුකැලේවත්ත නොහොත් කිනගහගාවාහේන (වරිපනම් නො. 14A දරණ ඉඩමෙන් කොටසක්) | රබර් සහ හේන, අවුරුදු 10ක් 15ක් පරණ රබර්ගස් 19ක් තිබේ | බදුල්ලේ පදිංචි ඇන්. මාරසිංහ මැතිණිය | 0 2 14·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වෂී 1934ක්වූ පෙබරවාරි මස 23වෙනි දින පෙරවරු 2ට කසිඝමට බදුල්ල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වෂී 1934ක්වූ ජනවාරි මස 8වෙනි දින
බදුල්ල කච්චේරියේදීය.

ඒ. පී. මිලින්ටන්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වෂ්හ

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම් නො. 657 (මාතලේ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර් 1934ක්වූ ජනවාරි මස 12වන දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් හැටියට ගෙන ඊට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දන්නුම්දෙනු ලැබේ.

වර් 1933ක්වූ අගෝස්තු මස 26වෙනි දින මාතලේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෂ්හ.

(*a*) මෙමම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඹින් යන යම් පාරකට අයිතිකම් කීම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කේ මාතලේ උතුරු කෝරාළයේ වගපනහ උඩසියපත්තුවේ බිබිල යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

මූල් සිතියමේ නො. 8,619.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්ප්‍රමාණය, අ. රූ. ප |
|---|---|---|
| 3 | පල්ලේලන්ද හෙවත් කොලොන්ගස්ලන්ද . | 0 0 30 |
| 6 | කොලොන්ගස්ලන්ද .. .. | 4 2 28 |
| 8 | කොලොන්ගස්හේන .. .. | 7 2 32 |
| | | 12 2 10 |

මීට මායිම්—උතුරට එච්. ඇම්. අප්පුහාමි අයිතිකම්කියන වෙන්දේසිහේන, නො. 8,619 දරණ මූල් සිතියමේ නො. 2 දරණ බිම්කට්ටිය, නො. T. P. 424,047, 424,702 සහ 421,725 දරණ සිතියම්වල ඉඩම් සහ ඒ. පුංචිරාල සහ තවත් අයවලුන් විසින් සහ පී. පුංචිරාල විසිනුත් අයිතිකම්කියන පල්ලේලන්දේ හේන; නැගෙණහිරට දන්වැහැරවැව; දකුණට නාලිසුර ඇල සහ බස්නාහිරට නාලිසුරඇල සහ පාරද වෙත්.

## 1920සේ නොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

කළුතර නාගරික ප්‍රදෙශ සභාවේ නොම්මර 3ගේ කොට්ඨාසයට සභාජිකයෙක් තෝරාගැනීම පිණිස වෂී 1934ක්වූ පෙබරවාරි මස 14වෙනි බදාදා රැස්වීමක් පැවැත්වීමට අදහස්කර ගෙන තිබේ.

සභාජිකයෙකු වීමට ඉල්ලුම්කරණ අයගේ නම ලියවිල්ලකින් යෝජනාකළ යුතුයි. එම යෝජනාපත්‍රය ඉහත කියනලද කොට්ඨාසයේ ඡන්ද දෙන්නන්ගේ නාම ලැයිස්තුවේ පෙනෙන අයගෙන් අඩුගණනේ දෙදෙනෙක් විසින් අත්සන් කළයුතුවත් හැර මෙම පත්‍ර භාරගැනීමට නියමකර තිබෙන වෂී 1934ක්වූ පෙබරවාරි මස 14වෙනි බදාදා පූර්වභාග 10.30ට හෝ ඊට ප්‍රථම කළුතර නාගරික ප්‍රදෙශ සභා කන්තෝරුවට භාරදිය යුතුයි.

ඉහතකී කොට්ඨාසයට එක ඉල්ලුම්කරුවෙකුට වැඩිගණනක් යෝජනාකරණු ලැබුවොත්නම්; සභාජිකවරුන් තේරීමක් වෂී 1934ක්වූ පෙබරවාරි මස 27වෙනි අඟහරුවාදා මෙහි පහත සඳහන්කරණ ස්ථානයේදී පවත්වනු ලැබේ.

කැමැත්තගැනීමට උදේ 9ට පටන්ගෙන සවස 3ට සමාප්ත කරණු ලැබේ.

ඡන්දදෙන ස්ථානය : වේලාපුර කළුතර පරණ පාරේ තිබෙන කළුතර ඉදිනකාල පෙට්ටි සමාගමේ ගොඩනැගිල්ල.

පී. සරවණමුත්තු,
කළුතර උප ඒජන්ත වෂ්හ.

වෂී 1934ක්වූ ජනවාරි මස 5වෙනි දින
කළුතර කච්චේරියේදීය.

## ලංකා සේවිංස් බැංකුවේ පොලී පිළිබඳ දැන්වීම.

මෙමම බැංකුවේ මුදල් තැන්පත්කරන්නන්ට 3වෙනි නියෝගය යටතේ 1934රේ අවුරුද්දට ගෙවියයුතු පොලියේ ප්‍රමාණය රුපියල් 1,000ට වැඩිනොවන ගණන්වලට සියයට 3¼ක් සහ රුපියල් 1,000ත් වැඩි ගණන්වලට සියයට 3ක් බව එම බැංකුවේ ඩිරෙක්ටර්වරුන් විසින් මෙයින් දන්වනු ලැබේ.

හැන්රි ඒ. හේමර්,
සෙක්‍රතාරිස්තුමා.

වෂී 1934ක්වූ ජනවාරි මස 4වෙනි දින
කොළඹ ලංකා සේවිංස් බැංකුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO